සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

1337

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 தவணைமுடிப் பரீட்சை - 2026/Grade 13 Final Term Test - 2026

භූගෝල විද්‍යාව - I	22	S	I	කාලය நேரம் Time	පැය 03 යි

නම பெயர் Name ..... විභාග අංකය சுட்டிலக்கம் Index No. .....


උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතයි. I කොටස බහුවරණ ප්‍රශ්න 40ක් ඇතුළත්වන අතර, පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු යි.
- II කොටසට අදාළ ව ප්‍රශ්න දෙකට ම පිළිතුරු සැපයිය යුතු ය. III කොටස ප්‍රශ්න හතරකින් සමන්විත වන අතර, තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. (මේ සඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියමක් සහ ලෝක ආකෘති සිතියමක් සපයනු ලැබේ.

I කොටස

- වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය කුඩිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

1) 1 : 50 000 සිතියම් පත්‍රයක් පරිමාණයට අනුව වෙනස් කළ අවස්ථාවක් පහත A හා B රූප සටහනේ දැක්වේ. B සිතියමේ වර්ණ කරන ලද පරිමාණය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.



(1) 1 : 10 000
(2) 1 : 25 000
(3) 1 : 100 000
(4) 1 : 75 000
(5) 1 : 5 000

(.....)

2) 1: 50 000 භූ ලක්ෂණ සිතියමක පැත්තක දිග 8cm මගින් නිරූපණය කරන සමචතුරස්‍රාකාර කොටසක, සැබෑ භූමියේ වර්ග කිලෝමීටර් (km^2)ප්‍රමාණයක් නිරූපණය කරයි ද?

(1) 16 Km^2 (2) 32 Km^2 (3) 64 Km^2
(4) 8 Km^2 (5) 24 Km^2


(.....)

3) "මුද්‍රිත 1: 50 000 සිතියම් පත්‍ර 89 වේ. එසේ වීමට හේතු වන්නේ සිතියම් පත්‍ර යුගල තුනක් එකතු කොට මුද්‍රණය කිරීම නිසා ය." එලෙස දැක්වෙන සිතියම් පත්‍ර අංක යුගලයක් සහිත නිවැරදි පිළිතුර තෝරන්න.

(1) 81 සහ 82 (2) 71 සහ 72 (3) 54 සහ 55
(4) 33 සහ 34 (5) 62 සහ 64

(.....)

4) පහත දැක්වෙන උපාංග අතරින් භූගෝලීය තොරතුරු පද්ධතියට (GIS) අයත් ආදාන උපාංග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,



A B C D

(1) A හා B (2) B හා C (3) C හා D
(4) A හා D (5) B හා D (.....)

5) කඩදාසි මුද්‍රිත සිතියම් සකස් කිරීම සඳහා අතීතයේ භාවිත කරන ලද උපකරණයක් ඇතුළත් වරණය නොවන්නේ,

(1) මාලිමාව, තියොඩලයිට්
(2) තියෝඩලයිට්, ගුවන් යානා
(3) මාලිමාව, ගුවන් යානා
(4) දම්වැල හා මිනුම් පටිය, අංකන ඵලකය
(5) දම්වැල හා මිනුම් පටිය, මාලිමාව (.....)

6) අවකාශීය නොවන දත්ත මිනුම් කළ හැකි ක්‍රමයක් නොවන්නේ,

(1) නාමමාත්‍ර දත්ත (2) අනුක්‍රමික දත්ත (3) ප්‍රාන්තර දත්ත
(4) අනුපාත දත්ත (5) විවික්ත දත්ත (.....)

7) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියක් (GPS) මගින් ත්‍රිමාණ (3D) තොරතුරු නිවැරදිව ලබා ගැනීම සඳහා ග්‍රාහකයා අවම වශයෙන් චන්ද්‍රිකා කීයක් සමඟ සම්බන්ධ විය යුතු ද?

(1) 2 (2) 3 (3) 4
(4) 5 (5) 6 (.....)

8) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියක (GPS) පිහිටීම හඳුනා ගැනීමේ මූලික අවශ්‍යතාව වන්නේ,

(1) කාලය (time)
(2) කක්ෂ තල (Orbital Planes)
(3) ඇන්ටනා (Antenna)
(4) ඉඩම් තොරතුරු පද්ධති (LIS)
(5) ඔරලෝසුව (Clock) (.....)

9) ඇළ ගුවන් ඡායාරූප ලබා ගැනීමේ දී කැමරාවේ ප්‍රකාශන අක්ෂයේ ආනතිය පොළොවට සාපේක්ෂව අංශක කොපමණ ප්‍රමාණයකට වඩා වැඩි වෙයි ද?

(1) 3° (2) 4° (3) 5°
(4) 6° (5) 1° (.....)

CamScanner

10) සාමූහික දත්ත ව්‍යාප්තියක මධ්‍යන්‍ය ගණනය කිරීම සඳහා වඩා සුදුසු සූත්‍රය පහත සූත්‍ර අතරින් තෝරන්න.

(1) $\bar{x} = \frac{\epsilon x}{n}$ (2) $\bar{x} = x_{\circ} + \frac{(\epsilon fd)}{n} c$ (3) $x = \frac{\epsilon x^2}{n}$

(4) $\bar{x} = \frac{\epsilon fx}{n}$ (5) $x = \frac{\epsilon fx^2}{n}$ (.....)

11) "පෘථිවියේ අවකාශීය විවිධත්වය අධ්‍යයනය කිරීම" භූගෝල විද්‍යාව බව ප්‍රකාශ කළ භූගෝල විද්‍යාඥයා වන්නේ,

(1) කාල් රිටර් (2) රිචඩ් හාර්ට්ෂෝන්

(3) ඉරටොස්තිනිස් (4) ඇලෙක්සැන්ඩර් වොන් හම්බෝල්ට්

(5) හෙරඩෝටස් (.....)

12) තරංග ක්‍රියාවලිය හේතුවෙන් නිර්මාණයවන වෙරළ නිදසුන්ගත භූ රූප පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) භූම්මානය, බොක්ක (2) බොක්ක, ආරුක්කු (3) මඩතලා, භූම්මානය

(4) වැල්ල, ටොම්බෝලාව (5) මුහුදු ගුහා, මුහුදු කුළු (.....)

13) පහත පරිසර පද්ධතිය අතරින් "දමන තෘණ භූමි" ප්‍රදේශයක් වන්නේ,

(1) මාදුරු ඔය (2) මනම්පිටිය (3) විල්පත්තුව

(4) සෝමාවතිය (5) කඳපොළ (.....)

14) බුලුතොට හා හපුතලේ මොහොර නිර්මාණය වී ඇති ප්‍රධාන පාෂාණ වර්ගය කුමක් ද?

(1) වාකොනයිට් (2) කොන්ඩලයිට් (3) විපරීත

(4) ආග්නේය (5) අවසාදිත (.....)

15) පැයට කිලෝමීටර් ($1Km^{-1}$) 3000ක පමණ වේගවත් සුළං ධාරා දක්නට ලැබෙන වායුගෝලීය ස්ථරය කුමක් ද?

(1) ඕසෝන් ස්ථරය (2) පරිවර්තී ස්ථරය (3) අපරවර්තී ස්ථරය

(4) මෙසෝ ස්ථරය (5) තාප ස්ථරය (.....)

16) පුනීල මෝය ඩෙල්ටා භූ රූප ලක්ෂණ දක්නට ලැබෙන ගංගාවක් වන්නේ,

(1) නයිල් ගඟ (2) මිසිසිපි ගඟ (3) ටයිබර් ගඟ

(4) නයිජර් ගඟ (5) සේන් ගඟ (.....)

17) කැලිෆෝනියාව, චිලි, කේප්ටවුන් සහ ඕස්ට්‍රේලියාවේ පර්ත් හා ඇස්ලෙඩ් අවට ව්‍යාප්ත වී ඇති බියෝම වර්ගය වන්නේ,

(1) නිවර්තන වර්ෂා වනාන්තර බියෝමය (2) සෞම්‍ය කලාපීය වනාන්තර බියෝමය

(3) මධ්‍යධරණී බියෝමය (4) ටයිගා බියෝමය

(5) තෘණ භූමි හා සැවානා බියෝමය (.....)

CamScanner

18) ශ්‍රී ලංකාවේ වර්ෂාපතන අනුපාතයට සාපේක්ෂව වැඩිම අපධාවයක් සහිත නිත්‍ය ගංගාවක් වන්නේ,

(1) ගිං ගඟ (2) මහවැලි ගඟ (3) කළු ගඟ
(4) වලවේ ගඟ (4) කැළණි ගඟ (.....)

19) "හිරු ලප" ලෙස හැඳින්වෙන සූර්යයාගේ පිපිරුම් ස්ථානවලින් නිකුත්වන ගිනිදැල් නිවී යාමට ගතවන කාලය කොපමණද?

(1) වසර 10 යි. (2) වසර 11 යි. (3) වසර 12 යි.
(4) වසර 23 යි. (5) වසර 34 යි. (.....)

20) පාෂාණ පතනය, මඩදෝරය, ලිහිටුම වැනි සංසිද්ධීන් පහත භූ රූප නිර්මාණ ක්‍රියාවලි අතරින් කුමක් හා සම්බන්ධ වේද?

(1) සුනාමි (2) භූමි කම්පා (3) තරංග
(4) ස්කන්ධ හායනය (5) සුළං (.....)

21) සාමාන්‍ය වායුගෝලීය පීඩනය කොපමණ අගයක් ගනී ද?

(1) මිලිබාර 960 – 1045 (2) මිලිබාර 960 – 1020 (3) මිලිබාර 960 – 1040
(4) මිලිබාර 1060 – 1040 (5) මිලිබාර 1060 – 1040 (.....)

22) නිම්න ග්ලැෂියර් සඳහා බලපාන ග්ලැෂියර් සහිත කඳු අවම වශයෙන් කොපමණ උසකින් යුක්තයි ද?

(1) 4000 m (2) 6000 m (3) 2000 m
(4) 8000m (5) 10 000 m (.....)

23) උත්පාටන ක්‍රියාවලිය යන්න අර්ථ දැක්විය හැකි පිළිතුර වන්නේ,

(1) පාෂාණ කුට්ටි ගැලවී යාමයි. (2) පාෂාණ සිරී මෘදු වීමයි.
(3) පාෂාණ ඔපමට්ටම් වීමයි. (4) පාෂාණ පහළට තල්ලුවී යාමයි.
(5) පාෂාණ සිරී යාමයි. (.....)

24) කාන්තාරික ප්‍රදේශවල ජලය වේගයෙන් වාෂ්පීකරණය වීම මත නිර්මාණය වන භූ රූප ලක්ෂණයක් නොවන්නේ,

(1) දියලු අවාන් (2) ප්ලයා විල් (3) බහාඩා
(4) අපහරණ ද්‍රෝණි (5) මළ දොළ (.....)

25) නයිට්‍රජන්, පොටෑසියම්, කැල්සියම් හා මැග්නීසියම් මධ්‍යස්ථ ප්‍රමාණයකින් යුක්ත ඉහළ සශ්‍රීකත්වයක් ඇති පස් වර්ගය වන්නේ,

(1) රතු දුඹුර පස (2) ග්‍රැමුසෝල්ස් පස (3) රතු දුඹුරු ලැටසෝල් පස
(4) රෙගොසොල්ස් පස (5) රතු කහ ලැටසොල් පස (.....)

CamScanner

26) පෘථිවිය වෙත ලැබෙන සූර්ය විකිරණයෙන් පෘථිවි තලය හා ජල ගෝලය තාපවත් වීමට වැය වන සූර්ය විකිරණ ප්‍රමාණය වන්නේ,

(1) 51% (2) 36% (3) 29%
(4) 27% (5) 6% (.....)

27) ගුටෙන්බර්ග් අසන්තතිය වෙන් කරනු ලබන පෘථිවි ව්‍යුහයේ කොටස් දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ඉහළ හා පහළ ප්‍රාවරණය (2) ප්‍රාවරණය හා හරය
(3) කබොල හා ප්‍රාවරණය (4) මහද්වීපික කබොල හා සාගරික කබොල
(5) බාහිර හා අභ්‍යන්තර හරය (.....)

28) පහත නගර අතරින් ප්‍රතිමෝධක නගරයක් වන්නේ,

(1) මහනුවර (2) අනුරාධපුරය
(3) කතරගම (4) කඩුවෙල
(5) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ (.....)

29) 2050 වන විට ලෝක නාගරිකරණය 98% වඩා වැඩිවන රටක් නොවන්නේ, (2012 දත්ත අනුව)

(1) චීනය (2) සිංගප්පූරුව (3) කටාර්
(4) කුවේට් (5) ජපානය (.....)

30) මාස්ට්‍රිච්ට් සම්මුතිය (Treaty of Maastricht) නම් ගිවිසුම මගින් පිහිටුවා ගත් සංගමය කුමක් ද?

(1) යුරෝපා සංගමය (2) අග්නිදිග ආසියානු සංගමය
(3) සාර්ක් සංවිධානය (4) එක්සත් ජාතීන්ගේ සංවිධානය
(5) යුනෙස්කෝ සංගමය (.....)

31) 2025 වන විට සංචාරක ආකර්ෂණය ඉහළම රට වන්නේ මේ අතරින්,

(1) ස්පාඤ්ඤය (2) චීනය (3) ප්‍රංශය
(4) ඇමරිකා එක්සත් ජනපදය (5) ඉතාලිය (.....)

32) ගෝලීය වනිජ තෙල් සැපයුමෙන් 20% පමණ ප්‍රවාහනය කරන සමුද්‍ර සන්ධිය වන්නේ,

(1) ඩේවිස් සමුද්‍ර සන්ධිය (2) මලක්කා සමුද්‍ර සන්ධිය
(3) බාස් සමුද්‍ර සන්ධිය (4) ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය
(5) හෝමුස් සමුද්‍ර සන්ධිය (.....)

33) ආනයනික ක්ලින්කර් හා පිප්සම් භාවිතයට ගනිමින් සිමෙන්ති කර්මාන්තය පවත්වාගෙන යන ප්‍රදේශයක් වන්නේ,

(1) පුත්තලම (2) අම්පාර
(3) කන්කසන්තුරේ (4) ගාල්ල
(5) කිලිනොච්චිය (.....)

1305

CamScanner

34) "ජගත් මිහිතල දිනය" යෙදී ඇත්තේ කවදා ද?

(1) අප්‍රේල් 22 (2) ජූනි 05 (3) ජූලි 11
(4) සැප්තැම්බර් 17 (5) ඔක්තෝබර් 04 (.....)

35) ශ්‍රී ලංකාවේ මිනිරන් අපනයනය මත "තලාතූ මිනිරන්" වැඩි ම ප්‍රමාණයක් මිලදී ගනු ලබන රට වන්නේ,

(1) ඇ.එ. ජනපදය (2) ජපානය (3) චීනය
(4) දකුණු කොරියාව (5) ජර්මනිය (.....)

36) ශ්‍රී ලංකාවේ ඛනිජ වැලිවල විරලව ඇති රසායනික මූලද්‍රව්‍ය අඩංගු වී ඇත. එසේ නොවන රසායනික මූලද්‍රව්‍ය වන්නේ,

(1) සර්කොන් (2) ටයිටේනියම් (3) තෝරියම්
(4) ටන්ග්ස්ටන් (5) ආගන් (.....)

37) කෙටි කාලීනව අස්වනු ලබාගත හැකි "සුන්ඩාමායි" නම් බාර්ලි විශේෂය වගා කරන රට කුමක් ද?

(1) බංගලාදේශය (2) පකිස්ථානය (3) ඉන්දියාව
(4) චීනය (5) ශ්‍රී ලංකාව (.....)

38) වයඹ දිග එංගලන්තයේ සිට ඉතාලියේ ජිනෝවා තෙක් බණ්ඩිතව විහිදුණු නාගරික කලාපය වන්නේ,

(1) ගෝල්ඩන් බනානා කලාපය (2) ග්‍රීන් බනානා කලාපය
(3) බොෂ්වොෂ් කලාපය (4) ටොකයිඩෝ කලාපය
(5) බ්ලූ බනානා කලාපය (.....)

39) ගාල්ල දිස්ත්‍රික්කයේ "ගැමී-නාගරික" ලෙස හැඳින්වෙන ප්‍රදේශ නිවැරදිව දැක්වෙන පිළිතුරක් වන්නේ,

(1) කොග්ගල, තලගහ (2) ඉමදුව, කරාපිටිය (3) පින්නදුව, ලබුදුව
(4) උඩුගම, තලගහ (5) කරාපිටිය, කොග්ගල (.....)

40) ජනාවාස ධූරාවලිය පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) නගරය, මහ නගරය, පුරවරය, නගර සමූහිතය
(2) නගරය, පුරවරය, නගරයාය, නගර සමූහිතය
(3) නගරය, කුඩා නගරය, මහ නගරය, පුරවරය
(4) නගරය, මහ නගරය, නගර සමූහිතය, නගර යාය
(5) නගරය, කුඩා නගරය, නගර සමූහිතය, පුරවරය (.....)

CamScanner

II කොටස

- මෙම කොටසේ ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

1) සපයා ඇති 1:50 000 හූ ලක්ෂණ සිතියම් කොටස ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සිතියම් මත පහත දක්වා ඇති ස්ථානවල පිහිටි හූ ලක්ෂණ මොනවාදැයි තෝරා ලියන්න.

a. M – N රේඛාවෙන් දැක්වෙන්නේ,

b. P – S රේඛාවෙන් දැක්වෙන්නේ,

c. U – V රේඛාවෙන් දැක්වෙන්නේ, (ල. 03)

ii. X සිට Y දක්වා හමුවන හූ ලක්ෂණ දෙකක් දක්වන්න. (ල. 02)

iii. සිතියම් පත්‍රය කුමන හූ විෂමතා කලාපයට අයත් ද? (ල. 01)

iv. සිතියම මධ්‍යයේ නැගෙනහිර - බටහිර දිශාගතව ඇති ගංගාව හරහා දක්වා ඇති මායිම් හඳුන්වන නම් ලියන්න. (ල. 03)

v. සිතියමේ රවුම් කරන ලද කොටසේ දක්නට ලැබෙන ආයතන තුනක් නම් කරන්න. (ල. 03)

vi. සිතියම්ගත ප්‍රදේශයේ දැක්වෙන ත්‍රිකෝණමිතික ස්ථානයේ උස කොපමණ වේද? (ල. 01)

vii. සිතියම් ගත ප්‍රදේශය ජනාවාස බහුල නොවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

viii. මෙම 1:50 000 හූ ලක්ෂණ සිතියම් කොටසට අනුව හූ විෂමතා ලක්ෂණ හා මාර්ග ජාලය අතර පවතින සම්බන්ධතාවය කෙබඳුදැයි කෙටියෙන් දක්වන්න. (ල. 04)

2) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. (ල. 10)

1. මැංචූරියානු තැන්න
2. පැරානා ගඟ
3. කූක් සමුද්‍ර සන්ධිය
4. කෝලා අර්ධද්වීපය
5. මාඟල් දූපත
6. පිරනිස් කඳුවැටිය
7. කුරේෂිවෝ ප්‍රවාහය
8. මලාවි විල
9. ලෝකයේ ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළම රට
10. පෙන්ගා (Penha) නිවර්තන කුණාටුව ඇති වූ රට

CamScanner

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

ප්‍රශ්න අංකය	02	භූගෝල විද්‍යාව - I	II කොටස	22	S	I	විභාග අංකය : .....

PAST PAPERS WIKI

CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province


1300

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026/Grade 13 Final Term Test - 2026

භූගෝල විද්‍යාව - I /புவியியல் - I/ Geography I	22	S/T/E	I	කාලය நேரம் Time	පැය 03 යි

නම பெயர் Name ..... විභාග අංකය கட்டிலக்கம் Index No. .....

ශ්‍රී ලංකා මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 පරිමාණයේ සිතියම් පත්‍ර කොටසකි. සමෝච්ඡ රේඛා අන්තරය 20m වේ.



III කොටස

- මෙම කොටසින් තෝරා ගත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.

3) i. සිතියම යන්න නිර්වචනය කරන්න. (ල. 02)
ii. තේමා සිතියම් සකස් කරන ක්‍රම තුනක් දක්වන්න. (ල. 03)
iii. තේමා සිතියම් හා භූ ලක්ෂණ සිතියම් අතර වෙනස්කම් දක්වන්න. (ල. 04)
iv. භූගෝල විද්‍යාවේ දී තොරතුරු සන්නිවේදනය කිරීමට ප්‍රායෝගික භූගෝල විද්‍යාත්මක ක්‍රම ශිල්පවල භාවිත කිරීමේ වැදගත්කම උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 06)

4) i. නව සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්ප යන්න හඳුන්වන්න. (ල. 02)
ii. කාර්යක්ෂම ලෙස භූගෝලීය තොරතුරු පද්ධතියක් (GIS) නිර්මාණය කිරීමට සුදුසු පරිගණකයක පැවතිය යුතු මෙවලම් තුන නම් කරන්න. (ල. 03)
iii. භූගෝලීය තොරතුරු පද්ධතියක (GIS) අඩංගු ප්‍රධාන දත්ත කොටස් දෙක උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)
iv. භූගෝලීය තොරතුරු පද්ධතියක (GIS) දත්ත ගබඩා කිරීමේ ආකෘති දෙක රූප සටහන් සහිතව පැහැදිලි කරන්න. (ල. 06)

5) i. ප්‍රස්ථාර යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)
ii. දත්ත දෘශ්‍ය මාධ්‍යයෙන් ඉදිරිපත් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවා ද? (ල. 04)
iii. රටක වාර්ගික හා ආගමික සංයුතිය නිරූපණයට යෝග්‍ය ප්‍රස්ථාර ක්‍රමය කුමක් ද? එම ප්‍රස්ථාරික ක්‍රමවේදය නිර්මාණය කරගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)
iv. සම සංඛ්‍යා සිතියම් සහ රේඛාංකිත සිතියම් යන්න කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

6) පහත වගුව මගින් දැක්වෙන්නේ ගාල්ල දිස්ත්‍රික්කයේ වසර දහයක වාර්ෂික වර්ෂාපතනය (mm) වේ.

වගු අංක 1: වර්ෂ 2013 - 2022 දක්වා වාර්ෂික වර්ෂාපතනය (mm) - ගාල්ල දිස්ත්‍රික්කය

වර්ෂය	වර්ෂාපතනය (mm)
2013	1799
2014	2635
2015	2577
2016	1981
2017	2433
2018	2284
2019	3024
2020	2198
2021	2635
2022	2714

ඉහත දත්ත භාවිත කරමින් ගාල්ල දිස්ත්‍රික්කයේ,
i. වාර්ෂික වර්ෂාපතනයේ මධ්‍යනය සොයන්න. (ල. 04)
ii. මධ්‍යනය අපගමනය සොයන්න. (ල. 05)
iii. අපගමන ප්‍රස්තාරය අඳින්න. (ල. 06)

CamScanner

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අවසාන වාර පරීක්ෂණය - 2026

භූගෝල විද්‍යාව II - 13 ශ්‍රේණිය

පිළිතුරු පත්‍රය

I කොටස - භෞතික භූගෝලීය විද්‍යාව

1) i. ගලන ජලය, සුළඟ, ග්ලැසියර්, තරංග, භූගත ජලය, ස්කන්ධ ජලය

ii. ක්‍රම තුන (බාදනය, පරිවහනය, නිධි සාධනය) (නම් කිරීමට ලකුණු 01යි)
(විස්තර කිරීමට ලකුණු 05යි)

බාදනය	නිධිසාධනය
සිදුවන ආකරය උත්පාටනය උල්ලේඛය පිරිසැරීම භූ රූප ගර්ක / ගිරිවිල් අරේට, පිරමීඩාකාර කඳු u හැඩ නිම්න, ලම්බ නිම්න, පිත්තපටි විල්	වර්ග (ආංශික/ මැදි / පිළිගමන් / අක්)

iii. ප්‍රධාන සාධක 02 - භෞතික/ මානුෂ (ල. 02)
(විස්තර කිරීමට එක් කරුණකට 02 බැගින් කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු 04යි.)

භෞතික	මානුෂ
වර්ෂාපතන තීව්‍රතාවය	අක්‍රමවත් භූමි පරිහරණය
බෑවුමේ ස්වභාවය	අවධිමත් ඉදිකිරීම්
භූ ව්‍යූහය	වනාන්තර විනාශ කිරීම
භූ කම්පන	පිපිරීම් මගින් ඇති කරන කම්පන
පාෂාණ ජීර්ණය	පතල් කැණීම්
භූගත ජලය	ස්වභාවික ජල මාර්ග අවහිර කිරීම
හිම බලපෑම	

iv. ආපදා කළමනාකරණ නිර්වචනයට ලකුණු 02යි.
(ගුරු මාර්ගෝපදේශය පිටු අංක 56/ EM DAT නිර්වචනය)
එක් කරුණකට ලකුණු දෙක බැගින් විස්තර කිරීමට ලකුණු 04යි.

ඉංජිනේරුමය ක්‍රම - Catch dains - බෑවුමට අනුව ජලය බැස යාමට ක්‍රමවත් කානු පද්ධතිය
Weep holes - භූගත ජලය බැස යාමට සිදුරු සහිත බට යොදා ගත් රැඳවුම් බිත්ති

Retaining walls පස් කන්ද රඳවා තබා ගැනීමේ කොන්ක්‍රීට් රැඳවුම් බිත්ති
Gobion walls බෑවුම් ස්ථායි කිරීමට ගැල්වනයිස් කරන ලද කම්බි දැල්වලට ගල් පිරවීම.
බෑවුම් කෝණය අඩු කිරීම.
බෑවුම පඩිපෙළවල් ලෙස සකස් කිරීම.

2) i. මානව ක්‍රියාකාරකම් නිසා වායුගෝලීය ස්වභාවික සංයුතිය වෙනස් වී පෘථිවියේ සාමාන්‍ය උෂ්ණත්වය ඉහළ යාමත්, දේශගුණික රටා අහිතකර ලෙස දිගු කාලීන වෙනස් වීමත්ය. (ගැළපෙන පිළිතුරකට ලකුණු 02යි)

ii. අ). සූර්ය ලප / උල්කාපාත

ආ). හරිතාගාර ආවරණය / ගිනිකඳු පිපිරීම / සාගරික සංසරණය (එල්නිනෝ, ලාහිතා)
(නිවැරදිව නම් කිරීමට ලකුණු 02යි)
(කරුණු දෙකක් විස්තර කිරීමට ලකුණු දෙක බැගින් ලකුණු 04කි.)

iii. 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 11 අනුව නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

iv. 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 13 අනුව නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

3) i. 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 66 අනුව නිවැරදි පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

ii. අ). අක්ෂාංශීය පිහිටීම
මුහුදු මට්ටමේ සිට උස
ගොඩබිම හා සාගර ව්‍යාප්තිය
භූගත සුළං (ලකුණු 04යි)

ආ). වියළි පතනශීඝ්‍රතාවය - ඉහළ නගින වායුව සනීභවන මට්ටම තෙක් සිසිල් වන අවස්ථාව තෙක් ඇතිවන පතන සීඝ්‍රතාවයයි.
තෙත් පතන සීඝ්‍රතාවය - සනීභවන මට්ටමෙහි ඉහළට තවදුරටත් උෂ්ණත්වය අඩුවී, වැඩි ආර්ද්‍ර තත්ත්වයක් ඇතිවන්නේ නම් තෙත් පතන සීඝ්‍රතාවයයි.
(ලකුණු 02යි)

iii. සමකයෙන් උතුරට - A - ඊසාන දිග වෙළඳ සුළං / (උප නිවර්තන වැඩි පීඩන කලාපය)
B - බටහිර සුළං / (උප ද්‍රැවීය අඩු පීඩන කලාපය)
C - ධ්‍රැව නැගෙනහිර සුළං / (ධ්‍රැවීය වැඩි පීඩන කලාපය)

සමකයෙන් දකුණට - B - ගිනිකොණ දිග වෙළඳ සුළං / (උප නිවර්තන වැඩි පීඩන කලාපය)
C - බටහිර සුළං/ (උප ධ්‍රැවීය අඩු පීඩන කලාපය)
(නිවැරදි පිළිතුරු තුනට ලකුණු ලබාදෙන්න. ලකුණු 03යි.)

කොරියෝලිස් බලය යනු පෘතුවියේ පීඩන තිරවල පිහිටීම අනුව වැඩි පීඩනයේ සිට අඩු පීඩන තීර දෙසට සුළං හැමීම සිදුවේ. මෙම ගෝලීය සුළං වල දිශාව තීරණය වීමේ දී පෘථිවියේ අප ක්‍රමණය සමඟ

සම්බන්ධ වන බලයයි. ඒ අනුව උත්තරාර්ධ ගෝලයේ දක්ෂිණාවර්තව ද, දකුණු අර්ධ ගෝලයේ වාමාර්ථව ද සුළං හැමීම සිදුවෙයි.

(නිවැරදි පිළිතුරකට ලකුණු 03යි. 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 76 අනුව)

iv. (ගුරු මාර්ගෝපදේශය 12 ශ්‍රේණිය පිටු අංක 79 අනුව කලාප දෙකක් නම් කිරීමට ලකුණු 04ක්ද විස්තර කිරීමට ලකුණු 02ක්ද ලබා දෙන්න.)

4) i. අනෙන්ද්‍රීය ද්‍රව්‍යවලින් සමන්විත ඛනිජවලින් ද ඓන්ද්‍රිය ද්‍රව්‍ය විපරීත වීමෙන්ද පාෂාණ නිර්මාණය වේ.
ශිලාගෝලය පාෂාණ වලින් නිර්මාණය වී ඇත.
උපත අනුව පාෂාණ වර්ග 03කි. (ආග්නේය, අවසාදිත, විපරීත)
(කරුණු දෙකක් දැක්වීමට ලකුණු 02යි)

ii. (ආග්නේය පාෂාණ කොටස් 02 දැක්වීමට ලකුණු 02යි.)
ආක්‍රාන්ත ආග්නේය පාෂාණ
නිෂ්ක්‍රාන්ත ආග්නේය පාෂාණ
(ගුරු මාර්ගෝපදේශය 12 ශ්‍රේණිය පිටු අංක 18 අනුව අවසාදිත පාෂාණ වර්ග අනුව විස්තර කිරීමට ලකුණු 04යි.)

iii. අ). ප්‍රාග් ක්‍රේෂත්‍රීය පාෂාණ (ලකුණු 02යි)
ආ). A - උස්බිම් ශ්‍රේණිය B - වන්නි සංකීර්ණය
C - විජයානු සංකීර්ණය D - කඩුගන්නාව සංකීර්ණය
(ලකුණු 04යි)

iv. වියළි හා තෙත් කලාප දෙකෙහිම - දුර්වල ජල වහනයක් සහිත නියුලික් පස්, දියලු පස, සොල්ස් පස
(නිවැරදි පිළිතුරු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02යි)
(ගුරු මාර්ගෝපදේශය 12 ශ්‍රේණිය පිටු අංක 28 අනුව විස්තර කිරීමට ලකුණු 04යි.)

II කොටස - මානුෂ්‍ය භූගෝල විද්‍යාව

5) i. ජනසංඛ්‍යා විශාලත්වය - කිසියම් නිශ්චිත භූගෝලීය ඒකකයක් තුළ නිශ්චිත කාලයකදී වෙසෙන මුළු මිනිස් සංඛ්‍යාව ප්‍රමාණාත්මකව ගණනය කර දැක්වීමයි.
ජන සංඛ්‍යා වර්ධනය - උපත් සංඛ්‍යාව, මරණ සංඛ්‍යාව ඉක්මවා යාමයි.
(ලකුණු 02යි)

ii. අ). ස්ථාවර
ප්‍රාසාරණ
හායන
ප්‍රාථමික (ලකුණු 02යි)

ආ). 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 101 සහ 102 අනුව නිවැරදි පිළිතුරු ලිවීමට (සංසන්දනය කරමින්) ලකුණු 04යි.

Past Papers Wiki

iii. 12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 102 – 105 දක්වා විස්තර කිරීම් සඳහා 3x2 ලකුණු 06යි.

iv. සාධක - උපත්
මරණ
සංක්‍රමණ (ලකුණු 02යි)

ධණාත්මක ප්‍රතිලාභ - අධි ජන සංඛ්‍යා ගැටලුවට පිළියමකි.
සේවා නියුක්තියට ප්‍රතිකර්මයකි.
විදේශ විනිමය උපයා ගත හැකි වීම.
සංවර්ධනයට හිතකර ආකල්ප හා කුසලතා ව්‍යාප්ත වීමට උපකාරී වීම.

(නිවැරදි පිළිතුරු දෙකක් විස්තර කිරීමට ලකුණු 04යි.)

6) i. නාගරික ජන සංඛ්‍යාවේ ස්වභාවික වර්ධනය
ග්‍රාමීය නාගරික ජන සංක්‍රමණ
පරිපාලන සීමා වෙනස් කිරීම. (ලකුණු 02යි)

ii. ගැටලු තුන දක්වා විස්තර කිරීමට ලකුණු 2x3බැගින් ලකුණු 06කි.
(ගුරු මාර්ගෝපදේශය 12 ශ්‍රේණිය පිටු අංක 145 – 147)

iii. සාධක - ගම හා නගරය අතර දැඩි විෂමතාවයක් නොවීම.
ප්‍රාථමික ප්‍රදේශවලට සම්පත් යොමු කර තිබීම.
යටිතල පහසුකම්වල දියුණුව.
ඕනෑම ස්ථානයකට දිනක් ඇතුළත ගමන් කළ හැකි වීම.
සංවර්ධන ව්‍යාපෘති ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වීම.
(කරුණු හතර දැක්වීමට ලැබුණු 04යි, ප්‍රවණතාවය විස්තර කිරීමට ලකුණු 02යි)
12 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 153 අනුව ප්‍රවණතා දක්වා තිබීම.

iv. 12 ශ්‍රේණිය පිටු අංක 154 ගුරු මාර්ගෝපදේශය අනුව ලකුණු ලබාදෙන්න)

7) i. මූලද්‍රව්‍ය එකක් හෝ කිහිපයක් හෝ සංයෝග වීමෙන් සන හෝ ස්ඵටික ස්වරූපයෙන් නිර්මාණය වන්නා වූ දෑ ඛනිජ වේ. (ලකුණු 02යි)

ii. (ඛනිජ වැලි ව්‍යාප්තිය පැහැදිලි කිරීමට ලකුණු 02යි. ප්‍රවණතා දෙකක් විස්තර කිරීමට ලකුණු 04යි.)
(13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය පිටු අංක 81 – 82)

iii. (උදාහරණ සහිතව කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 06යි. ගුරු මාර්ගෝපදේශය පිටු අංක 85 – 87 - 13 ශ්‍රේණිය)

iv. ගුරු මාර්ගෝපදේශය පිටු අංක 88 (13 ශ්‍රේණිය) එක් මාතෘකාවකට ලකුණු දෙක බැගින් විස්තර කිරීමට මාතෘකා තුනට ලකුණු 06යි.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

8) i. වෙළඳාම හා ගනුදෙනු කිරීම.
ප්‍රාග්ධනය හා ආයෝජන
සංක්‍රමණය
දැනුම බෙදා හැරීම (ලකුණු 02යි)

ii. ගුරු මාර්ගෝපදේශය 13 ශ්‍රේණිය පිටු අංක 112 - 113 අනුව නිවැරදි පිළිතුරු වෙන් කොට ලියා ඇත්නම් එක්අ කරුණකට 01 බැගින් ලකුණු 06යි.

iii. ගුරු මාර්ගෝපදේශය 13 ශ්‍රේණියේ පිටු අංක 116 - 117 අනුව නිවැරදි පිළිතුරු දෙකකට ලකුණු තුන බැගින් ලකුණු 06යි.

iv. සාමාජික රටවල් - බංගලාදේශය / භූතානය / නේපාලය / ඉන්දියාව / මාලදිවයින / පකිස්ථානය / ශ්‍රී ලංකාව / ඇෆ්ගනිස්ථානය
(ලකුණු 03යි)

(අභියෝගයක් විස්තර කිරීමට ලකුණු 03යි.)
උදා: අපේක්ෂිත සහයෝගීතාවය රටවල් අතරින් ගිලිහී යාම. (ඉන්දු- පකිස්ථාන අර්බුදය)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank